## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## ශාස්ත්‍ර පීඨය

### ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2018/2019

### SOC 2220 – ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමාජ විද්‍යාව

පැ දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න

---

1. 'ස්ත්‍රී පුරුෂ සමාජභාවය' 'ස්ත්‍රී පුරුෂ භාවයෙන්' වෙනස් වන්නේ කෙසේදැයි පැහැදිලි කර මෙම වෙනස නිර්මාණය කිරීමේදී සමාජයේ හා සංස්කෘතියේ කාර්යභාරය උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

2. **එක්කෝ**

'ස්ත්‍රීවාදයෙහි ආරම්භය හා ව්‍යාප්තිය රේඛීය ක්‍රියාවලියක් නොවේ. එහි ඉදිරිපිම්, බණ්ඩනයන් හා පසුගාමී ප්‍රවනතා ද බොහෝ විය.' ස්ත්‍රීවාදී ව්‍යාපාරයෙහි ප්‍රධාන මූලධර්ම ඇසුරින් ඉහත ප්‍රකාශය විමසන්න.

**නැතහොත්**

'ස්ත්‍රීවාදී ව්‍යාපාරය පුරුෂාධිපත්‍යයේ ආරම්භය සහ ස්ත්‍රීන් පීඩනයට පත්කිරීම පිළිබඳ විවිධ පැහැදිලි කිරීම් ඉදිරිපත් කරයි.' අවම වශයෙන් ස්ත්‍රීවාදී එළඹුම් දෙකක් පරිශීලනය කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

3. ස්ත්‍රීවාදී පර්යේෂණ ක්‍රමවේදයෙහි මූලික ප්‍රස්තුතයන් මාග්‍රට් අයික්ලර් ගේ අදහස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සාකච්ඡා කරන්න.

4. 'සමාජීය වශයෙන් පිළිගැනෙන දැනුමෙහි නිර්මාණය සහ ව්‍යාප්තිය පැහැදිලි ලෙසම ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පදනමක් මත ගොඩනැගෙන ක්‍රියාවලියකි.' ස්ත්‍රීවාදී ඥානමීමාංසාව ඇසුරින් ඉහත ප්‍රකාශය විභාග කරන්න.

5. 'සංස්ථාපිත ආගම් තුළින් මනුෂ්‍යයන්ගේ ආධ්‍යාත්මික විමුක්තිය ලබාදී ඇත්තේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය පසුබිමක් තුළ පිහිටාය.' මෙම ප්‍රකාශය සමග ඔබ එකඟ වන්නේද? ඔබේ පිළිතුර උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

6. 'ස්ත්‍රීපුරුෂ සමාජභාවීය ප්‍රචණ්ඩත්වය බහුල වශයෙන් ස්ත්‍රිය කෙරෙහි යොමු වීමට ප්‍රධාන හේතු වන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමාජානුයෝජනය සහ සමාජය විසින් එය සාධාරණීකරණය කිරීමයි.' මෙම ප්‍රකාශය විභාග කරන්න.

**************